**ශීර්ෂ 321 -** නැගෙනහිර පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව **- 2016** වර්ෂය

**------------------------------------------------------------------------------------------**

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

-------------------------------------

1.1 දැක්ම

-------

පළාතේ ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂා තෘප්තිමත් කරන උසස් පාලන ක්‍රමයක් ඇති කිරීම.

1.2 මෙහෙවර

------------

ජනතාවගේ වැඩිදියුණු වූ ජීවන තත්ත්වයක් උදෙසා කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබාදීම සඳහා සම්පත් එක්රැස් කිරීම හා ඒවා ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

1.3 කාර්යභාරය

--------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. ගිණුම්

-------

2.1 විසර්ජන ගිණුම

------------------

මුළු ප්‍රතිපාදන හා ගිණුම

---------------------------

නැගෙනහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 22,048.59 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 19,880.66 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,167.93 ක් හෙවත් සියයට 9.83 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 17,166.14 | 17,016.14 | 150.00 | 0.87 |
| මූලධන | 4,882.45 | 2,864.52 | 2,017.93 | 41.33 |
| එකතුව | 22,048.59 | 19,880.66 | 2,167.93 | 9.83 |

3. විගණන නිරීක්ෂණය

------------------------

පාර්ලිමේන්තුව විසින් ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගණනය කරන ලද අතර ඒ අනුව උපයෝජනය කරන ලදී. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.